# කොළඹ විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව
# නීති පීඨය

## නීතිවේදී උපාධි පරීක්ෂණය, පළමු වසර - 2018 (පුනර්.)

## අපරාධ නීතිය
(පැ තුනයි )

මුළු ප්‍රශ්න සංඛ්‍යාව : **07**

<u>අනිවාර්ය පළමු ප්‍රශ්නයද ඇතුලුව</u> ප්‍රශ්න <u>හතරකට</u> පිළිතුරු ලියන්න
(නොපැහැදිලි අත්අකුරු සඳහා ලකුණු අඩු කෙරේ.)

---

01. **(i)** වැන් ඩර් හල්ට්ස් එ. නීතිපති (*Van Der Hultes v. The Attorney General*) [1989] (1) Sri. L.L.R 204 යන නඩු තීරණයේ වැදගත්කම සාකච්ඡා කරන්න.

**(ii)** එක්තරා සාදයකදී බීමත් වන X, අළුයම සිය නිවස වෙත වාහනය පදවාගෙන යයි. පදිකයන් මාරුවන ස්ථානයකදී, පදිකයන්ට පාර හරහා මාරු වීමට ඉඩදීම සඳහා වාහන වලට රතු මාර්ග සංඥා එලි දැල්වී තිබුනද, ඔහු සිය රථය නොනවත්වා ධාවනය කිරීමේ ප්‍රතිඵලයක් ලෙස පදිකයකුව රිය අනතුරකට ලක්කරයි. තම මත්වීමේ තත්වය නිසා රතු සහ කොළ මාර්ග සංඥා වෙන් කොට හඳුනා ගැනීමට නොහැකි වූ බවට X සමාව අයදියි.

ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහය යටතේ X කිසියම් විත්තිවාචකයක් සඳහා හිමිකම් ලබයිද?

**(iii)** විශ්ව විද්‍යාලයේ පරිගණක කාමරයේ ඇති පරිගණකයක් උපයෝගි කරගනිමින් R ඔහුගේ අපරාධ නීතිය පැවරුම සකස් කරයි. R පරිගණක කාමරයෙන් පිටව ගිය වහාම Rගේ මිතුරෙකු වන S එම පරිඝනකයම භාවිතා කරයි. Rගේ පැවරුම පරිගණකයේ තිබෙන බව සොයාගන්නා S එය පිටපත් කරයි.
උක්ත සිද්ධිය තුල කිසියම් වරදක් සිදුකර තිබේද? සාකච්ජා කරන්න.

(iv) A සහ ඔහුගේ මිතුරන් පස්දෙනෙකු, ඔවුන්ගේ ප්‍රියතම නළුවාගේ චිත්‍රපටය නිකුත් කරන ප්‍රථම දිනයේදීම එම චිත්‍රපටය නැරඹීමට යයි. දර්ශන වේලාවට බොහෝ කලින්ම "ඉඩකඩ නොමැත" (House Full) යන පුවරුව සිනමා ශාලාවේ එල්ලා තිබෙනු දැකීමෙන් ඔවුන්ගේ බලාපොරොත්තු සුන්වේ. ඔවුන් සිනමා ශාලාව වෙත ගල් කැට විසිකිරීමේ ප්‍රතිඵලයක් ලෙස වීදුරු කිහිපයක් බිඳී යයි.

A සහ ඔහුගේ මිතුරන් පස්දෙනාගේ අපරාධ වගකීම සාකච්ඡා කරන්න.

(v) සාපරාධී විශ්වාසය කඩකිරීම (criminal breach of trust) යන වරද ඔප්පු කිරීමට අවශ්‍ය මූලිකාංග පැහැදිලි කරන්න.

02. සීමා සහිත තරු බිස්කට් සමාගමේ පෙර සේවකයෙකු වන තිසේරා විෂමාචාරයක් හේතුවෙන් සේවයෙන් ඉවත් කිරීමෙන් දින දෙකකට පසුව රාත්‍රියේදී සමාගමේ කර්මාන්ත ශාලාව වෙත යයි. ආරක්ෂක නිලධාරියෙක සමාගම් පරිශ්‍රයේ ඇති ගබඩා කාමරයෙන් පිටතදී ඔහුව අල්ලාගනී. පරිශ්‍රයට ඇතුළු වූයේ කෙසේද යන ප්‍රශ්නයට වලංගු හේතුවක් සැපයීමට තිසේරා අපොහොසත් වීම නිසා ඔහුව පොලිසියට භාර දෙයි. ඔහුගේ සාක්කු සහ ඔහුට අයත් දේ පරීක්ෂා කිරීමේදී ඔහුගේ සන්තකයේ තිබී භූමිතෙල් බෝතලයක් සහ ගිනිපෙට්ටියක් හමුවෙයි. කිසියම් වරදක් කිරීමට තැත් කිරීම සම්බන්ධයෙන් තිසේරාට විරුද්ධව චෝදනා නැගිය හැකි ද?

උචිත මූලධර්ම, ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන හා නඩු තීරණ නීතිය උපුටා දක්වමින් සාකච්ඡා කරන්න.

3. "...තමන් සිදු කළ ක්‍රියා සම්බන්ධයෙන් කිසිදු ආකාරයකට දොස්පැවරිය නොහැකි තැනැත්තන්ව අපරාධකරුවන් කිරීමට පාර්ලිමේන්තුව චේතනා නොකළ බවට පූර්වනිගමනයක් සියවස් ගණනාවක සිට පවතියි. එයින් අදහස් වන්නේ මානසික අංගය (*mens rea*) සම්බන්ධයෙන් යම් වගන්තියක් නිහඬ වන විටදී පාර්ලිමේන්තුවේ චේතනාවට බලාත්මක භාවය දීම සඳහා එම වචන මානසික අංගය (*mens rea*) අවශ්‍ය වන බවට උචිත වන ලෙස අප විසින් කියවිය යුතු බවයි. මානසික අංගය (*mens rea*) අවශ්‍ය නොවන

බව තිරණය කිරීම සඳහා යම් හේතුවක් සොයාගත හැකි නම් මිස සෑම වරදක් සම්බන්ධයෙන්ම මානසික අංගය (*mens rea*) අත්‍යාවශ්‍ය මූලිකාංගයක් බව බලධාරී අධිකාරයන් ගණනාවකදි ප්‍රබල ලෙස ස්ථාපිතව තිබේ.''

ස්වීට් එදිරිව පාර්ස්ලි (*Sweet v. Parsley*) [1970] AC 132; [1969] 2 WLR 470 යන යන නඩුවේ දි රීඩ් සාමිවරයා දැක්වන ලද ප්‍රකාශයකි.

යථාර්ථ වගකීම පිළිබඳ මූලධර්මය (doctrine of strict liability) ඇසුරින් උක්ත ප්‍රකාශය විවේචනාත්මකව අගයන්න.

04. 'රාජා දියවැඩියා රෝගියෙකි. එක්තරා සන්ධ්‍යාවක ඔහු සිය මෝටර් බයිසිකලයෙන් නිවස බලා යමින් සිටියදි කලන්ත ස්වාභාවයක් ඇති වෙයි. ඔහු මෝටර් බයිසිකලය නවත්වා අසල ඇති සිල්ලර වෙළඳසැලකට යයි. ඔහු කැඩ්බරි චොකලට් පෙත්තක් හා රෙඩ්බුල් බීම ඇතුලත් ඇසුරුමක් ඩැහැ ගෙන ඉවතට දිව යයි. පසුව සිදුකරන ලද සෝදිසියකදි, ඔහු අසල ඇති උද්‍යානයක හිඳගෙන චොකලට් පෙත්තක හා පානය රසවිඳමින් සිටියදි සොයා ගන්නා ලදි.

දණ්ඩ නීති සංග්‍රහයේ ප්‍රතිපාදන හා විනිශ්චිත නඩු තීරණ ආශ්‍රයෙන් රාජාගේ අපරාධ වගකීම සාකච්චා කරන්න.

05. රෙක්ස් ගම තුල අප්‍රසාදයට පත්ව ඇති පුද්ගලයෙකි. එක් දිනක, රෙක්ස්ගේ අසල්වැසියකු වන සෝමපාල පොල් ඇහිදීමට රෙක්ස්ගේ ඉඩමට පැමිණෙයි. සෝමපාල හා අමනාපයෙන් පසුවන සිල්වා මෙය දකියි. සිය ඉඩමේ පඳුරු වලට පිටුපසින් ඇති පැලැටි වඳුරන් කිහිපදෙනෙක් විසින් විනාශ කරන බව සිල්වා ඉක්මනින්ම රෙක්ස්ට දැනුම් දෙයි. රෙක්ස් පඳුර දෙසට වෙඩි තබන අතර පඳුර පිටුපස සිටින සෝමපාලට ඉන් තුවාල සිදු වෙයි. වෙඩි ශබ්දය ඇසී අසල්වැසියන් දෙදෙනකු වන කමල් හා නිගම් වහා රෙක්ස්ගේ ඉඩම දෙසට පැමිණ ඒ පිළිබඳව විමසා සිටියි. රෙක්ස් සිය නිවස තුලට ඉක්මනින් ගොස් කඩුවක් ගෙනවිත් කමල්ගේ දකුණු අත කපා දමයි. එහි ප්‍රතිඵලයක්

ලෙස කමල්ගේ දකුණු අත ආබාධිත තත්වයට පත්වෙයි. කමල්ව බේරාගැනීමට නිගම් උත්සහ ගත් අවස්ථාවේ, රෙක්ස් නිගම්ටද පහර දී ඔහුගේ ඇසකට හානි සිදුකරයි. අසල්වැසියන්ගේ මැදිහත්වීමෙන් සෝමපාල, කමල් හා නිගම් අසල ඇති රෝහලට ඇතුලත් කරයි. රෝහලට ඇතුලත් කළ වහාම සිය තුවාල හේතුවෙන් සෝමපාල මියයයි. වෛද්‍යවරුන් දැනුම් දුන් ආකාරයට කමල්ගේ දකුණු අත නැවතත් තිබූ තත්වයට පත්කළ නොහැකි අතර නිගම්ට සති තුනක පමණ කාලයකින් සිය පෙනීම යලි ලබාගත හැකි බවයි.

විනිශ්චිත නඩු තීරණ උපුටා දක්වමින් ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහය යටතේ රෙක්ස් හා සිල්වා විසින් සිදුකර ඇති වරදවල් සාකච්ඡා කරන්න.

06. (i) රටක දණ්ඩන නීතීන් ඵලදායි ලෙස ක්‍රියාවට නැංවීම සඳහා දඬුවම් (sentencing) අත්‍යාවශ්‍ය වේ. කෙසේවුවත්, යම් දඬුවමක් පැනවීමේදි එහි අරමුණු පෙන්නුම් කරන පැහැදිලි ප්‍රතිපත්තියක් තිබිය යුතුය. එසේ නොවුනහොත් ප්‍රජාව එම දඬුවම් අනුමත නොකරනු ලැබිය හැකි අතර අපරාධ යුක්ති පද්ධතිය (criminal justice system) පිළිබඳ ඇති විශ්වාසය අඩු වේ.

ඔබ උක්ත ප්‍රකාශය සමග එකගවන්නෙහිද? සාකච්ඡා කරන්න.

(ii) අපරාධ නඩුවකදි "වැරදීම" (mistake) විත්තිවාචකයක් ලෙස ඔප්පු කිරීමේදි එහි අත්‍යාවශ්‍ය මූලිකාංග ස්ථාපිත කිරීම අවශ්‍ය වේ.

උචිත දණ්ඩ නීති සංග්‍රහ ප්‍රතිපාදන හා නඩු තීරණ ආශ්‍රයෙන් සාකච්චා කරන්න.

07. දාහතර හැවිරදි ගැහැණු දරුවකු වන කමලා රිහාන් සමග සම්බන්ධතාවයක් ඇති කරගනී. අදාළ සිද්ධිය වූ දිනයේදි, කිසිවකුටත් නොපවසා ඔහුව හමුවීමට පැමිණෙන ලෙස රිහාන් කමලාගෙන් ඉල්ලා සිටී. කෙසේවුවත්, කමලා ඇයගේ මිතුරියක වන සුමනාට මේ පිළිබඳව පවසයි.

රිහාන් සිය මෝටර් බයිසිකලයෙන් කමලාව ඇය නොදන්නා ස්ථානයකට රැගෙන යයි. එම ස්ථානයට ඇතුලු වන විටම එය නවාතැන්ගන්නා තානායමක් (guest house) බව කමලා වටහා ගනී. රිහාන් ඇයව එහි වූ කාමරයකට රැගෙන යන අතර ඒ වන විටත් ඔහුගේ මිතුරන් දෙදෙනෙක් එහි සිටියහ. මෙහිදී අපහසුතාවයට පත්වූ කමලා එම ස්ථානයෙන් පිටව යාමට තිරණය කලත් රිහාන් එහි වූ දොර අගුලු දැමීය. රිහාන් ඔහුගේ මිතුරන් දෙදෙනාගේ සහාය ඇතිව කමලාව සිහිමඳ තත්වයට පත් කිරීමට යම් මත්ද්‍රව්‍යක් ඇයට එන්නත් කරයි. කමලා පන්තියෙන් පසු නිවස වෙත නැවත නොපැමිණි නිසා කමලාගේ දෙමාපියන් සුමනාව සම්බන්ධ කර ගන්නා අතර එහිදී කමලාට රිහාන් සමඟ ඇති සම්බන්ධතාවයත්, අදාළ දිනයේ ඔවුන්ගේ හමුවීම පිළිබඳවත් සුමනා හෙළිකළාය. පසුව, මාර්ගයේ සිහිසුන්ව වැටී සිටියදී කමලාව හමුවෙයි. ඇයගේ ශරීරයේ කිසිදු පෙනෙන තුවාලයක් නොතිබූ නමුත් ඇගේ ගවුමේ ලේ පැල්ලම් තිබෙනු දක්නට ලැබෙයි.

උචිත අධිකාරීන් ඇසුරින් රිහාන් සහ ඔහුගේ මිතුරන් දෙදෙනාගේ අපරාධ වගකීම සාකච්ඡා කරන්න.

*